සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி , சமூக பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No DSD/HO/IT/11/ADB

ඔබේ අංකය / உமது இல / Your No ..........................................

දිනය / திகதி / Date 2025.01.21

**සියලු දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ**

**දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය , සහකාර අධ්‍යක්ෂවරුන්,**

**<u>ADB ණය ආධාර මත 2022 සැප්, ඔක්, දෙසැ: මාස සඳහා සමෘද්ධි, වැඩිහිටි, වකුගඩු, ආබාධිත, නිත්‍ය, අමතර හා පොරොත්තු දීමනා ගෙවීම් කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධව බැංකු මට්ටමින් සකස් කළ මුදල් ගෙවීමේ නාම ලේඛන සකස් කර සාරාංශ වාර්තාව සමඟ ADB වෙත ලබා දෙන ලදි. එම වාර්තා ඔවුන් විසින් පරීක්ෂා කිරීම් වලින් අනතුරුව එම වාර්තා වල අඩුපාඩු රැසක් ඇති බව දක්වා ඇත. එම අඩුපාඩු සකස් කර 2025.01.27 දිනට පෙර ADB වෙත ලබා දෙන ලෙස දක්වා ඇත. එසේ නොවුනහොත් ADB ලබා දී ඇති ඇ.ඩො. මිලියන 154 මුදල ඩොලර් වලින් නැවත ADB වෙත ගෙවිය යුතු බව දන්වා ඇත.

02. බැංකු ලබා දී ඇති වාර්තා වල පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය වී ඇත. නිරීක්ෂණය වූ අඩුපාඩු සම්බන්ධයෙන් පරීක්ෂා කළ යුතු කරුණු,

1. ප්‍රතිලාභී නම් ඇතුළත් Excel sheet එක මෙහි අමුණා ඇති ආකෘතියට අනුව විය යුතුය. (Cell merge නොකළ යුතුය.
2. නම් ඇතුළත් Excel sheet වල එකතුව පරික්ෂා කර බැලිය යුතුය.
3. ප්‍රතිලාභී නම් ඇතුලත් sheet වල යටින් නිරීක්ෂණ (comment) ඇතුළත් නොවිය යුතුය.
4. ප්‍රතිලාභී නම් ඇතුලත් ශීට් වල එකතුව පරික්ෂා කළ යුතුය.
5. නාම ලේඛන ඇතුලත් ගිණුම් වල මුදල, ගිණුම් අංකය, නම ඇතුලත්ද යන්න පරීක්ෂා කල යුතුය. (සමහර මුදල් ඉදිරියේ ගිණුම් අංකය/ නම ඇතුලත් නොවූ Sheet ඇත.)
6. බැංකුවේ ගෙවීම් වලට අදාල සාරාංශ වාර්තාවේ නම් ප්‍රමාණයට හා මුදලට ප්‍රතිලාභී නාම ලේඛනයේ නම් සංඛ්‍යාව හා මුදල සමාන විය යුතුය.
7. සාරාංශ වාර්තාවේ ප්‍රමාණය හා මුදලට නාම ලේඛනය නොගැලපේ නම් ඒ සම්බන්ධව පැහැදිලිව සටහන් කර දිස්ත්‍රික් මට්ටමින් එක් වාර්තාවක් එවිය යුතුය.
8. දිස්ත්‍රික් සාරාංශ වාර්තාවේ එකතුවට ප්‍රතිලාභී නම් ඇතුලත් වාර්තා වල එකතුව සමාන විය යුතුය.

03. ඉහත අඩුපාඩු ඉතා ඉක්මනින් නිවැරදි කර 2025. 01.27 දිනට පෙර දිස්ත්‍රික් මට්ටමින් එකතු කර ප්‍රධාන කාර්යාලයේ දිස්ත්‍රික් භාර නිලධාරින්ට ලබා දිය යුතු වේ. මේ සඳහා අප ලබා දුන් සාරාංශ වාර්තාව හා බැංකු විසින් සකස් කර ඇති ගෙවීම් නාම ලේඛන වල ඇති පවුල් සංඛ්‍යාව හා මුදල සමාන විය යුතුය. මෙම ක්‍රියාවලිය ඉක්මන්

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |

කිරීම සඳහා 2025.01.22 දින සිට බැංකුවක නිලධාරියෙකු දිස්ත්‍රික් කාර්යාලයට අදාළ වාර්තා වල soft copy සමඟ ගෙන්වා ගෙන වාර්තා පරීක්ෂා කර අවසන් වාර්තාව සකස් කල යුතුය.

04. දිස්ත්‍රික් කාර්යාලයේ විගණන හා බැංකු අධීක්ෂණ නිලධාරින් මෙම කාලය තුල දිස්ත්‍රික් කාර්යාලයේ රඳවා ගෙන මෙම කාර්යය සඳහා උදවු ලබා ගැනීම කළ යුතුය.

05. ප්‍රධාන කාර්යාලයේ දිස්ත්‍රික් භාරදී ඇති නිලධාරි නාම ලේඛනය මේ සමඟ යොමු කරමි.

06. මෙම කාර්යය සිදු කල යුතු ආකාරය 2024.07.02, 2024.07.16 හා 2024.07.18 යන දින වල ඔබ වෙත නිකුත් කල උපදෙස් ලිපි/ චක්‍රලේඛණ වල ඇතුලත්ය.

07. බැංකු විසින් මේ වන විට වියදම් ලෙස වාර්තා කළ මුදලට අදාළ වාර්තාව 2024 ජුලි මාසයේදී ඔබ වෙත ලබා දී ඇත. එම වාර්තා ඔබ සතුව නොමැති නම් එය ප්‍රධාන කාර්යාලයේ දිස්ත්‍රික් භාර නිලධාරින්ගෙන් ලබා ගත යුතුය.



**සී.ඩී. කළුආරච්චි**

අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්:-**

1. ලේකම් - ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.පි.
2. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.